ජාතික නිදහස් පෙරමුණ
தேசிய சுதந்திர முன்னணி
**National Freedom Front**

ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ කොටුව.

<u>උතුර හා නැගෙනහිර පළාත්වල ජාතිවාදී ආක්‍රමණශීලිත්වය වර්ධනය වීම.</u>

ගරු ජනාධිපතිතුමනි,

ඔබ උතුරු පළාත තුළ පැවති පසුගිය "පොංගල්" සමරු උත්සවයේ දී ද, මෑතක දී පැවැති බෞද්ධ නොවන ආගමික නායකයන් මුණගැසුන අවස්ථාවේ දී ද කියා සිටියේ, නැවත ජාතිවාදයට නැගී සිටීමට ඔබගේ පාලනය ඉඩ නොදෙන බවය. ඔබ ඒ කියා සිටියේ සියළු ජාතිවාදයන්, අන්තවාදයන් හා බෙදුම්වාදයට ද අදාළව වන්නට ඇතැයි සිතූ බොහෝ දෙනා ඒ අදහස පිළිබඳ සතුටුවන්නට ඇතැයි මම සිතමි. එසේ වුවත්, මේ වන විට සිදුවෙමින් පවතින සිදුවීම් අනුව බැලූ කල දැන් පැහැදිලිව ඇත්තේ ඔබ කියන ලද ජාතිවාදයට LTTE ජාතිවාදී උසිගැන්වීම අදාළ නොවන බවය. එසේ අදාළ වන්නේනම් පසුගිය සමීප කාලය තුළ උතුර හා නැගෙනහිර පළාත්වල පහත සඳහන් අමු ජාතිවාදී හා බෙදුම්වාදී ක්‍රියා සිදුවන්නට ඉඩ දී ඔහේ බලා සිටින ප්‍රතිපත්තියක් ඔබගේ ආණ්ඩුව විසින් අනුගමනය කරනු ඇතැයි සිතිය නොහැක.

I. යාපනයේ පුරාණ රජමහා විහාරයක් වූ තිස්ස විහාරයට ආගමික කටයුතු සඳහා පෝය දිනයට බෞද්ධයන්ට පැමිණීම වලකා තිබීම.

II. රටපුරා විවිධ නගරවල පිහිටුවා ඇති "බැරිස්ටා" නැමැති ජාත්‍යන්තර සන්නාමය යටතේ වන කෝපි අවන්හල යාපනය නගරයෙන් ඉවත් කිරීම. එය දෙමළ නොවන ජාතිකත්වයට අයත් ව්‍යාපාර වලට යාපනයේ ඉඩ නැත යන මතය මත පිහිටා සිදු කරන ලද්දක් බව සැඟවිය යුතු නැත.

III. උතුරේ වඩුන්නාගල ඓතිහාසික බෞද්ධ පුරාවිද්‍යා පුදබිම, පුරාවිද්‍යා පනතට පටහැනිව යමින් හින්දුකරණයට ලක් කිරීමට LTTE ජාතිවාදී සුළුතරයකට ඉඩ ලබා දී තිබීම.

IV. කොටි ත්‍රස්තවාදියකු වූ තිලීපන්ව, පසුගිය කාලය පුරා "ලුතිනන් කර්නල්" යන පට්ටමද සහිතව සිහිකර, නිදහසේ සමරු වැඩ සටහන් පැවැත්වීම. එමගින් තහනම් සංවිධානයක් වූ කොටි සංවිධානයේ කොඩි, සංකේත ප්‍රදර්ශනය හා වීරත්වයට නැංවීම සිදු නොකළ යුතු බවට වන නීතිය අමු අමුවේ උල්ලංඝනය කිරීමට ඉඩදී ඔබගේ පාලනය විසින් අවනීතිය රජ කරවීමට දැනුම්වත්ව දායක වීම.

මෙම උත්සව සඳහා පාසැල් වෙලාව තුළ සිය නිලඇඳුම වෙතින් සැරසුණු උතුරේ පාසැල් දරුවන් ගුරුවරුන්ගේ ද සහභාගිත්වය ඇතිව සහභාගි කර තිබුණේ අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍ර ලේඛණ ද බල්ලට දමාය. එතැනදි ද ඔබේ නීතිය ක්‍රියාත්මක වීම අප්‍රාණිකය.

V. මඩකලපුවේ දිවුල්පතාන ගමේ සිය නිත්‍යානුකූල ඉඩම්වල ජීවත්වන සිංහල සුළුතරය එම ප්‍රදේශයෙන් එලවා දැමීම සඳහා එලිපිට ක්‍රියා කරන්නේ, LTTE හිතවාදී, ජාතිවාදී හා බෙදුම්වාදී ඔබේ හිතමිතුරු පාර්ලිමේන්තු මන්ත්‍රී ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම්ය. සිංහල

No.428/1, Robert Gunawardena Mawatha, Battaramulla.
Telephone: 0112 807 903 | E mail: jnpsrilanka1@gmail.com | Web: www.jnpsrilanka.lk

ජනතාව සිය කෘෂිකාර්මික කටයුතු සඳහා කලක් තිස්සේ යොදාගත් මහවැලි ව්‍යාපාරයට අයත් ඉඩම් වෙත ඔවුන්ට ඇති ප්‍රවේශය එම අධිකාරිය විසින් වලකා දමනු ලැබුවේ ඔබේ ආණ්ඩුවේ ආශිර්වාදය හිමිව ඇත්තේ ජාතිවාදී රාසමාණික්කම්ට මිස එම අහිංසක, සුළුතර සිංහල වැසියන්ට නොවන නිසාය. පසුගියදා අමාරුවෙන් බීජ වපුරන ලද එම සිංහල ගොවියන්ගේ ඉඩම් වෙත කිරිහරක් රැලක් රාසමාණික්කම් විසින් එවන ලද්දේ එම වපුරන ලද බීජ සහිත බිම වනසා දමන්නටය. මේ සියලු ජාතිවාදී අපරාධ සිදුවන විටත් ඔබේ ආණ්ඩුවේ නීතියේ ක්‍රියාකාරිත්වය විශ්මය දනවන තරමට අකර්මණ්‍යය, අප්‍රාණවත්ය.

ගරු ජනාධිපතිතුමනි,

ඉහත මා සඳහන් කරන ලද හා නොකළ සියලු සිදුවීම් LTTE ජාතිවාදී, බෙදුම්වාදී උවමනාව මත සිදුකෙරෙන ද්‍රේය. අද මෙකී පළාත් දෙකේ ශ්‍රී ලංකා පොලිස් නිලධාරින් නීතියේ ආධිපත්‍යය පවත්වාගෙන යාමේ ඉමහත් අර්බුදයකට ලක්කොට ඇත. මේ සියල්ලෙන් පෙනීයන්නේ ඔබ LTTE ජාතිවාදයට හා බෙදුම්වාදයට නිදහසේ වැඩෙන්නට ඉඩදී, ඊට එරෙහි ජනමතය ජාතිවාදය ලෙස හංවඩු ගසා එයට එරෙහිව පමණක් නීතියේ අවිය යොදා ගැනීම "ජාතිවාදයට හිස එසවීමට යළි ඉඩ නොදෙමි" යන ඔබගේ ප්‍රකාශයෙහි සැබෑ අරුත වන බවය.

LTTE බෙදුම්වාදී ෆැසිස්ට්වාදයෙන් මේ රට වීරෝධාර රණවිරුවන් විසින් බේරාගත්තේ, ඔබට හෝ මතු රාජ්‍ය නායකත්වය හිමිකරගනු ලබන කවරකුට හෝ ඒ මහා ජීවිත පූජාවන්ගෙන් ලබාගත් ජයග්‍රහණ ආපසු හැරවීමට ඉඩ දී "බකන් නිලාගෙන" සිටීමට නොවේ. මෙම රාජ්‍යයේ ඉතිහාසය නිර්මාණය කළ සිංහලයාට හිමි එකම භූමිය සිංහලයාගෙන් උදුරාගැනීමට ඉඩදී බලා සිටීමට නොවේ. තමන්ට අනන්‍ය අක්ෂර මාලාවක් සහිත භාෂාවක් ක්‍රි.පූ. 3 - 2 සියවස් දක්වා දිවෙන අතීතයක දී මේ බිම මත උපදවාලුයේ සිංහලයා ය.

පිරිසිදු බුද්ධාගම හෙවත් ථේරවාද බුදුදහම ත්‍රිපිඨකය ග්‍රන්ථාරූඪ කරමින් ලෝකයට ආරක්ෂා කර දුන්නේ සිංහල බෞද්ධ මහාසංඝරත්නය හා ගිහියාය. එම බුදුදහම හා බැඳුණු සහ්‍යත්වය අනෙකුත් ජන කොටස් හා ආගමික විශ්වාසයන්ට නිදහසේ පැවතීමට අවස්ථාව සලසා දුන්නා මිස බැහැර කළේ නැත. එහෙත් ඒ ගුණය නිවටකමක් ලෙස දැකීම වරදවා වටහාගැනීමක් බව කිව යුතුය.

එබැවින්, ගරු ජනාධිපතිතුමනි,

ඔබ වෙතින්, ඉතා ඕනෑකමන් ඉල්ලා සිටින්නේ මා ඉහත දක්වා ඇති LTTE ජාතිවාදී, බෙදුම්වාදී ක්‍රියා නතර කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන්ය. මඩකලපුවේ සිංහල සුළුතරය එම භූමියෙන් පලවා හැරීමේ "වාර්ගික ශුද්ධය" වහාම නතර කරන මෙන්ය. රාජ්‍ය නායකයා වන්නේ ඔබනම්, ඔබ එය සිදු කල යුතුමය. ඒ සඳහා කඩිනමින් පියවර ගන්නා මෙන් ඉල්ලා සිටින අතරම, එසේ නොකර සිටීම මගින් අනවශ්‍ය ජාතිවාදී ගැටීමකට ඔබ විසින්ම මග පාදනු ඇති බව කණගාටුවෙන් යුතුව වුවද පවසා සිටිමි.

ස්තුතියි,
මෙයට,
විශ්වාසී.

විමල් වීරවංශ
නායක,
ජාතික නිදහස් පෙරමුණ
2026.10.06